ජාතික නිවුන් ලේඛනාගාරයේ
ප්‍රවෘත්ති පත්‍රිකාව

වෛද්‍ය අධ්‍යාපනාංශය මාරෙ,
වෛද්‍ය පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
තලංගමවිල, නුගේගොඩ

spjuats@iop.kcl.ac.uk
nipuna@stmail.lk

# නිවුන් පුවත්

කාණ්ඩ අංක - 02 | අගෝස්තු 2002 | පිටු අංක 1 -4

## බහු උපත් පදනමේ ප්‍රථම ජාතික සමුළුව ළඟදීම

නිවුන් සහ බහු උපත් පුද්ගලයන් හා ඔවුන් අයත් පවුල් ඒකක අප සමාජයේ සුවිශේෂ අවශ්‍යතාවයන්ගෙන් සමන්විත කණ්ඩායමකි. මේ නිසා නිවුන් සහ බහු උපත් පුද්ගලයන් සහිත පවුල් වලට මතුවන සුවිශේෂ ගැටළු හා අපහසුතා හඳුනා ගෙන ජාතික මට්ටමේ සුභසාධන ක්‍රියාවලියක් ගොඩනැඟීම අවශ්‍යව ඇත. මේ කාර්ය සඳහා නිවුන් සහ බහු උපත් සහිත පුද්ගලයන්ගේ පවුල් ඒකරාශී කිරීමෙන් පිහිටුවීමට අදහස් කරන බහු උපත් පදනමේ පළමු ජාතික සම්මේලනය ඉදිරි මාස 3 ඇතුළත පැවැත්වීමට බලාපොරොත්තු වෙමු.

ජාතික නිවුන් ලේඛනාගාරය මූලික වශයෙන් පර්යේෂකයන්ට නායකත්වය සපයන සංවිධානයක් වන හෙයින්, නිවුන් පුද්ගලයන්ගේ නායකත්වය හා මඟ පෙන්වීම යටතේ ගොඩ නැගෙන සංවිධානයක් අද කාලීන අවශ්‍යතාවයක්ව ඇත. මේ සඳහා දැනට පවතින බහු උපත් ශාඛා සාමාජිකයන්ට අමතරව අවුරුදු 18 ට වැඩි නිවුන් පුද්ගලයන් හා ඔවුන්ගේ පවුල් වල අයට සහභාගී විය හැක. මෙම සමුළුවට සහභාගී වීමට කැමති පුද්ගලයන්ට ඒ පිළිබඳව වැඩි විස්තර පහත ලිපිනයෙන් ලබා ගත හැක.

බහු උපත් පදනම
ජාතික නිවුන් ලේඛනාගාරය මාරෙ,
තැ. පෙ. 4, මුල්ලේරියාව

**වෙබ් දොරටුව**
http://www.infolanka.com/org/twin-registry

## කතුවැකිය

### නිවුන් පර්යේෂණ හා ඔබේ වගකීම්

ලෝකයේ නව දැනුම නිර්මාණය වන්නේ සෑම ක්ෂේත්‍රයකම සිදුකරන පර්යේෂණ තුරිනාය. එලෙසම නව ප්‍රතිකාර ක්‍රම හා දියුණු වෛද්‍ය පහසුකම් ස්ථාපිත වන්නේත් මෙවැනිම පර්යේෂණ මඟින්ය. විද්‍යාඥයන්ගේ හා වෛද්‍ය ප්‍රජාවේ යුතුකම් හා වගකීම් අතර ප්‍රධාන තැනක් පර්යේෂණ වලට හිමිවන්නේ මේ නිසාය. වෛද්‍ය ප්‍රජාවේ තැනිතම් එක් එක් වෛද්‍යවරයාගේ කාර්යය වන්නේ රෝගීන්ට ප්‍රතිකාර කිරීම පමණක්ම නොවේ. නමුත් අවාසනාවකට දියුණුවන ලෝකයේ බොහෝ රටවල්වල ජනතාව අතර මෙන්ම වෛද්‍යවරුන් අළුද මෙම පුළුල් සංකල්පය ව්‍යාප්තව නොමැත. මේ වූ නිසාම දියුණු බටහිර රටවල කරනු ලබන පර්යේෂණ මතම පමණක් යැපීමට තැතිතම් විශ්වාස තැබීමට අප පුරුදු පුහුණුව ඇත. එසේ වුවද එම රටවල සිදුකරන පර්යේෂණවල න්‍යාය පත්‍රය සකස්ව ඇත්තේ අපේ උවමනාවන් සඳහාම

4 වෙනි පිටුවට ☛

## ඔබ ඇති හැකි පවුලක නිවුන් සාමාජිකයෙක් ද?

එසේ නම් ඔබ කැමති ද ආර්ථික දුෂ්කරතා සහිත පවුලක නිවුන් සාමාජිකයකුට ආධාර කරන්න. ජාතික නිවුන් ලේඛනාගාරයට දිනපතා ගලා එන ලිපි මඟින් බොහෝමයක, නිවුන් දරුවන් ඇති දෙමාපියන් තම දරුවන් රැකීමේදී මතුවන ආර්ථික අසීරුතා ගැන පවසා සිටිනවා. මීට අමතරව විවිධ ජනමාධ්‍ය මඟින් ද ඔවුන් මුහුණ දෙන ගැටළු සහ දුෂ්කරතා පිළිබඳ වාර්තා වෙනවා. මේ පිළිබඳ නිවුන් සහ බහුඋපත් සංවිධානයේ මැදිහත් වීමෙන් වැඩපිළිවෙලක් සැකසීමට අදහස් කරනවා. මෙම වැඩපිළිවෙල සැකසීමේදී ඇති හැකි නිවුන් සාමාජිකයන් සහිත පවුල් සඳහා ලබා දිය හැකි දායකත්වය අතිවිශාල බව අපගේ හැඟීමයි. ඔබත් කැමතිනම් ඔබ වැනි නිවුන් සාමාජිකයකුට අනගිත දීමට කරුණාකර පහතින් දක්වා ඇති දුරකතනය/ලිපිනය මඟින් අපට දන්වන්න. තවද අප සංවිධානයට අනුබද්ධ ප්‍රාදේශීය නිවුන් සංගම්වල සාමාජිකත්වය දරන අඩු ආදායම් ලාභී පවුල්වල නිවුන් දරුවන් සඳහා පාසල් උපකරණ හා අභ්‍යාස පොත් පත් ලබා දීමේ වැඩසටහනක් අප විසින් ආරම්භ කර ඇත. මේ සඳහා දිවයින පුරා විසිරී සිටින අනුග්‍රාහක මහත්ම මහත්මීන් සහ පුන්‍ය ආයතන වල සහයෝගය ලබා ගැනීමට අප ලේඛනාගාරය බලාපොරොත්තු වේ.

<u>විමසුම</u> :
විශේෂඥ වෛද්‍ය සිසිර සිරිබද්දන
අධ්‍යක්ෂක,ජාතික නිවුන් ලේඛනාගාරය
ලිපිනය :
තැ. පෙ. 4, මුල්ලේරියාව
දුරකථනය / ෆැක්ස් : 578336

ඊ-මේල් : spjuats@iop.kcl.ac.uk
nipuna@stmail.lk

දිවයින 2001.12.22

මාතර රෝහලේදී උපත් තුන් නිවුන් දරුවන් කඳ වඩා ගැනීමට පිහිට පතයි

ලංකාදීප 2001.04.28

නිවුන්නු හතර දෙනාගෙ රෙදි සෝදලා අම්මගෙ අතේ පත්තු බැඳලා

ලංකාදීප 2001.04.08

මේ නිවුන් දරුවන් තිදෙනා ජීවත් කරවන්න උදව් කරන්න

දිවයින 2002.05.30

නිවුන් දරු දෙදෙනා නඩත්තු කරගත නොහැකිව මව වසබී දිවි නසාගෙන

දිවයින 2000.10.22

ළමයි හතර දෙනෙක් බිහිවුණ මට බය හිතුනා

ඔබ අ.පො.ස. උසස් පෙළ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා නිවුන් අධ්‍යයනයක යෙදෙන්නෙක් ද?
එසේ නැත්නම් වෙනත් අධ්‍යයනයක් සඳහා නිවුන් පර්යේෂණයක යෙදෙන්නෙක් ද?
ඒ සඳහා අපට සහය විය හැකියි. තොරතුරු දන්වා අපට ලියන්න

## අපේ වාර්තා

අලුත්ම වාර්තා අනුව අප ආයතනයේ ලියාපදිංචි නිවුන් හා බහුළපත් පහත අයුරින් ලේඛනගත වී තිබෙනවා.



| | | |
|---|---|---|
| නිවුන් උපත් | - | 5,324 |
| තුන් නිවුන් උපත් | - | 92 |
| සිව් නිවුන් උපත් | - | 02 |
| මුළු ගණන | - | 5,418 |

## නිවුන් පුද්ගලයන්ගේ හිමිකම් සහ අවශ්‍යතා පිළිබඳ ප්‍රකාශය

නිවුන් පුද්ගලයන් පිළිබඳ අධ්‍යයනයන් සඳහා වූ අන්තර් ජාතික සංගමයේ; බහු උපත් සංවිධානයන්ගේ කවුන්සලය මගින් 1995 දී සම්මත කර ගන්නා ලද නිවුන් පුද්ගලයන්ගේ හිමිකම් සහ අවශ්‍යතා පිළිබඳ ප්‍රකාශනයේදී අඩංගු ඇතැම් කරුණු වල සංක්ෂිප්ත සාරාංශය පහතින් දක්වා ඇත.

### නිවුන් පුද්ගලයන්ගේ හිමිකම්

1. ඕනෑම ආකාරයක අපයෝජනයන් වලින් නිදහස් වීමට ද එයින් ආරක්ෂා වීමට ද පෞද්ගලික හිමිකමක් සියලුම නිවුන් පුද්ගලයන්ට ද ඔවුන්ගේ පවුල් වලට ද ඇත්තේය.

2. පවුල් සැලසුම් ක්‍රම අනුගමනය කරන පිරිසට සහ දරුවන් නොලැබීමේ තත්ත්වයෙන් මිදීම සඳහා ප්‍රතිකාර ලබන්නන්ට නිවුන් දරු පිළිසිඳ ගැනීම් සිදු වීමේ අවස්ථා ඉහළ යාමට ඇති හැකියාව, එවැනි පිළිසිඳ ගැනීම් සමඟ ඇති අවදානම් / ප්‍රතිකාර සහ නිවුන් දරුවන් හදා වඩා ගැනීම පිළිබඳ කරුණු දැන ගැනීමටත් ඒ පිළිබඳ ඉගෙන ගැනීමටත් හිමිකමක් ඇත.

3. නිවුන් පුද්ගලයන් පිළිබඳ පෙරෙන ඕනෑම පර්යේෂණයක් සඳහා එම නිවුන් පුද්ගලයන්ගෙන් හෝ ඔවුන්ගේ දෙමව්පියන්ගෙන් කිසි අවසර තිබිය යුතුය. එමෙන් ම එම පර්යේෂණවලදී අන්තර් ජාතික චර්යා ධර්ම පද්ධතියට අනුගත විය යුතුයි.

4. නිවුන් දරු උපත් සහ මරණ නිවැරදි ව සටහන් කර ගත යුතුයි.

5. නිවුන් දරුවන්ගේ දෙමාපියනට අදාළ කරුණු පිළිබඳ විශේෂඥ දැනුම ඇති වෘත්තිකයන්ගේ සේවා ලැබීමට හිමිකම් ඇත්තේය.

6. සම අසම භාවය දැනගැනීමට අයිතියක් ඇත.

### නිවුන් පුද්ගලයන්ගේ අවශ්‍යතා

1. නිවුන් දරුවන් බිහි කිරීමට සුදානම් මවකට නිවුන් දරු පිළිසිඳ ගැනීම පිළිබඳ ව කල් ඇතිව දැන ගැනීමටත්, කිරි පෝෂණය සහ ඒ පිළිබඳ ව උපදෙස් හා අදාළ දරු උපත සඳහා අවශ්‍ය විශේෂ දැනුවත්භාවය සහ එය ලබා දීමේ සේවාත් අවශ්‍යය.

2. මවු කිරි දීමේ වැදගත්කම පිළිබඳ දැනුම සහ නිවුන් දරුවන් පෝෂණය කිරීම සඳහා අවශ්‍ය කිසි රාජකාරි නිවාඩු අවශ්‍යය.

3. වෛද්‍ය විද්‍යාත්මකව සළකා බැලීමේදී දුර්වල තත්ත්වයේ පසු වන නිවුන් දරුවන් සහිත පවුල් වලට එම තත්ත්වයට මුහුණ දීමට අදාළ විශේෂ කරුණු පිළිබඳ දැනුම මෙන් ම විශේෂ පහසුකම් ද අවශ්‍යය.



## ජාතික නිවුන් ලේඛනාගාරයට ජාත්‍යන්තර අවධානය

ජාතික නිවුන් ලේඛනාගාරය දැන් නිවුන් අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකත්වය ලබාගෙන තිබෙනවා. එහි ප්‍රධාන මධ්‍යස්ථානය ඕස්ට්‍රේලියාවේ පිහිටා තිබෙනවා. ඒ මගින් ජාත්‍යන්තරව සිදුකෙරෙන විද්‍යාත්මක සාකච්ඡා වලදී එම දැනුම බෙදා හදා ගැනීමට අප ආයතනයට ද හැකි වී තිබෙනවා. දියුණුවෙමින් පවතින රටවල නිවුන් පුද්ගලයන් සම්බන්ධව පර්යේෂණ සහ එම පර්යේෂණ ඇසුරින් අනාගතයේ දී අපට අවශ්‍ය සේවා තොරතුරු පද්ධතියක් ගොඩ නැගීම, අපේ අරමුණයි.

අප ආයතනය හා බැදෙන සියළුම නිවුන් දරුවන්/පුද්ගලයන් සඳහා ලියාපදිංචි අංක ලබා දීම සිදු කෙරෙනවා.

ඔබේ ප්‍රදේශයේ දැනටමත් අප ආයතනයේ ලියාපදිංචි නොවූ නිවුන් දරුවන්/පුද්ගලයන් ඇත්නම් ඒ පිළිබඳ විස්තර අපට ලැබෙන්නට සලස්වන්න. අප ආයතනයේ ලියාපදිංචි වීමට නිවුන්ගේ නැමැත්ත සහ අදාළ නිවුන් දරුවන්/පුද්ගලයන්ගේ උප්පැන්න සහතික පිටපත් එවීමෙන් සාමාජිකත්වය එතැවර ලබා ගත හැකිවේ. ඒ සඳහා ඔබට පහත ආකාරයේ ආකෘති පත්‍රයක් සකසා අප වෙත පහත ලිපිනයට යොමු කළ හැකියි.

ජාතික නිවුන් ලේඛනාගාරය බාරේ
තැ.පෙ. 4,
මුල්ලේරියාව

---

අයදුම්පත

1. නම ස්ත්‍රී/පුරුෂ
   1.______ 1.______
   2.______ 2.______
   (තුන් නිවුන් සහ සිවුනිවුන් සඳහා මේ ආකාරයෙන් 3, 4 ලෙස එම තොරතුරු සපයන්න)
2. උපන් දිනය ______
3. අත්සන
   1. ______
   2. ______
4. නිවුන් ළමුන් වයස 18 ට අඩු නම් මව හෝ පියාගේ අත්සන
   ______
5. තොරතුරු සපයන අයගේ නම ලිපිනය
   ______
6. උප්පැන්න සහතික නොමැතිනම්, තොරතුරු සත්‍ය බවට සහතික කරන අයගේ නම සහ ලිපිනය

## ජාතික නිවුන් ලේඛනාගාරයේ කමිටු සාමාජිකයින්

විශේෂඥ වෛද්‍ය නිහාල් අබේසිංහ
විශේෂඥ වෛද්‍ය ඩී. ඒ. ආර්. කේ. දයාරත්න
විශේෂඥ වෛද්‍ය දිල්නි ද සිල්වා
මහාචාර්ය දේවක ප්‍රනාන්දු
විශේෂඥ වෛද්‍ය සිසිර සිරිබද්දන
විශේෂඥ වෛද්‍ය අතුල සුමතිපාල
මහාචාර්ය නාරද වර්ණසූරිය

## සුබ පැතුම්

වෛද්‍ය ලුශෝකා සුරවීර මහත්මිය ඇයගේ පශ්චාත් උපාධි පාඨමාලාවට අදාළ පර්යේෂණ නිබන්ධය නිවුන් දරුවන් ඇසුරින් සාර්ථකව නිම කරනු ලැබ තිබෙනවා. එහිදී ඇය කළුබෝවිල සහ හෝමාගම ප්‍රාදේශීය වෛද්‍ය කාර්යාල බල ප්‍රදේශයන් ආශ්‍රිත වයස අවු. 0 - 3ත් අතර දරුවන්ගේ වර්ධනයට අදාළ තෝරාගත් සාධක කිහිපයක් අධ්‍යයනයට ලක් කර තිබෙනවා. මෙහිදී ජාතික නිවුන් ලේඛනාගාරය ඒ සඳහා තොරතුරු සැපයීමෙන් දායක විය. මෙම අධ්‍යයනයේ විශේෂත්වයක් වූයේ වෛද්‍ය සුරවීර මහත්මිය ද නිවුන් දරුවන් ඇති මවක් වීමයි.

## අපේ ඡායාරූප එකතුවෙන්





මේ අපේ සාමාජිකයන් අපට එවූ ඡායාරූප අතරින් තෝරාගත් ඡායාරූප. ඔබටත් හැකිනම් අප වෙත නිවුන් ඡායාරූප එවන්න. තෝරාගත් ඡායාරූප අපේ ඉදිරි නිවුන් පුවත් පත්‍රිකාවල පළ කිරීමට අප බලාපොරොත්තු වෙනවා. අපට ඡායාරූප එවූ සැමට ස්තුතියි.



ජාතික නිවුන් ලේඛනාගාරයට අනුබද්ධව නිවුන් සහ බහුළපත් සංවිධානය පටන් ගැනීමට පැමිණි නිවුන් දරු සංගමයේ සාමාජිකයන්

# නිවුන්නු, උළුක්කු සහ ජනප්‍රවාද

නිවුන් පුවත් පළමු කලාපයේ ඉහත මැයෙන් පළ කළ සටහනට ප්‍රතිචාර ලෙස අපට ලැබුණු ජන ප්‍රවාද ඇසුරින් සකසන ලද අධ්‍යයන වාර්තාව පහතින් දැක්වේ. එසේ තොරතුරු දැන්වූ සියළු දෙනාටම ස්තූතියි.

නිවුන්නු සම්බන්ධයෙන් පවත්නා ජනප්‍රවාද අතර නිවුන්නු ලවා උළුක්කු අද්දවා ගැනීම ඉතා ප්‍රචලිත ලෙස ලාංකීය සමාජය තුළ දක්නට ලැබෙන විශ්වාසයකි. එම ජනප්‍රවාදයන්ට අනුව නිවුන් සාමාජිකයෙක් හෝ නිවුන් සාමාජිකාවක් මගින් උළුක්කු අද්දවා ගැනීමෙන් එය සුවවන බව කියවේ. මේ සම්බන්ධයෙන් පවත්නා විද්‍යාත්මක සත්‍යතාව කෙතෙක් දුරට නිවැරදි ද යන්න අපි නොදනිමු.

නිවුන් යුගල් විස්සක් පමණ අපට තොරතුරු එවා තිබුණි. මින් උළුක්කු ඇදීමට කැමැත්ත ප්‍රකාශ කර තිබූ ප්‍රමාණය 90% ක් වූ අතර අනෙක් 10% උළුක්කු ඇදීමට අකමැත්ත ප්‍රකාශ කර තිබුණි.උළුක්කු අදින ආකාරය සැළකූ විට අධ්‍යයනයට හසු කරන ලද නිවුන්නු සියළුදෙනාම එකම ක්‍රමවේදයක් භාවිතා නොකරන බව පෙනියයි. එහෙත් 100%ක්ම ප්‍රකාශ කර ඇත්තේ "අත් වරුවක්" උළුක්කු ඇදීම සිදුකරන බවයි. උළුක්කු සුව වීමට උළුක්කු අදින ආකාරයේ බලපෑමක් ද ඇත.

".....මම සාමාන්‍යයෙන් අත් වරුවක් අතගානවා. එහිදී ආලේප කරන දේවල්වල විශේෂත්වයක් නැහැ. ගෙදර ඇති තෙල් වර්ගයක්, ඔවුන් රැගෙන එන තෙල් වර්ගයක් හෝ බාම් වර්ගයක් ගානවා. සමහරවිට කකුල් පෙරළිලා ඇවිදින්න බැරුව ඉන්න අය උස්සගෙන එනවා. ඒ අය සමහරු අල්ලන්නවත් දෙන්නෙ නැහැ. කෑ ගහනවා. හූ කියනවා. අපිට බය හිතෙනවා. මෙහෙම ගාලා සුවවේවි ද කියලා. ඒ උනත් ඔවුන් එයින් සැනීමකට පත් වෙනවා....."

අධ්‍යයනයට හසුකරන ලද නිවුන් යුගල් සමස්ථයම පවසන්නේ උළුක්කු ඇදීම සඳහා විශේෂිත ආලේපන වර්ගයක් යොදා නොගන්නා බවයි.

".....හදිස්සියට ගේන්නෙ කොයි තෙල් වර්ගයද කියල බලන්නෙ නැහැ. එහෙම නැත්නම් ගෙදර තියෙන පොල් තෙල් එහෙම නැත්නම් බාම් වර්ගයක් වගේ දෙයක් ගාලා හොඳට උළුක්කු වූ ස්ථානය පිරිමදිනවා....."

".....මෙය සනීප කරන මන්ත්‍රයක්වත් ගාථාවක්වත් මම දන්නෙ නැහැ. සමහර අය ගාලා ඉවර උනාම අහනවා මන්ත්‍රයක් කිව්වද කියලා. මට තියෙන්නේ කරණීය මෙත්ත සූත්‍රය තමයි. බොහෝ වෙලාවට මම එය සිතින් කියනවා. නැත්නම් ඒ වෙලාවට බුදුන් වඳිනවා....."

අප නියැදියට අයත් පුද්ගලයන් ප්‍රකාශ කළ ආකාරයට අනුව උළුක්කු ඇදීම නිසා සුව වූ ප්‍රමාණය 80%ක් පමණ වේ. ඉතිරි 20% සුව නොවූයේ උළුක්කු වීමට අමතරව එම සන්ධිවල සම්බන්ධතාවය විසන්ධි වී තිබූ බැවිනි. එවිට උළුක්කු ඇදීම මගින් සුව නොවන බව පැවසේ. එම අවස්ථාවලදී මෙම රෝගීන් කැඩුම්බිඳුම් වෛද්‍ය වරුන් ළඟට හෝ වෙනත් ප්‍රතිකාර සඳහන් යොමුවන බව ද සඳහන් විය.

".....ගමේ නොයෙක් වයස්වල පිරිස් පැමිණ අපිට කියා ඔවුන්ගේ උළුක්කු අද්දවා ගෙනයනවා. එයින් ඔවුන් සුව වෙනවා. පසුව ඔවුන් පැමිණ අපිට තෑගිබෝග පවාදීලා යනවා. අපේ හිතට හරිම සතුටක් දැනෙනවා ඔවුන් සුව වී සිටිනවා දැක්කාම....."

".....කකුල් උළුක්කු වූ අයගේ එම කකුල් නිවුන්නු ලවා පාගවා ගැනීමෙන් සුවවන බව සත්‍යයක්. අසල්වාසීන් කිහිප දෙනෙක්ම අපගේ දරුවන් ලවා උළුක්කු අද්දවා ගැනීම, පාගවා ගැනීම කරනවා. අත් වරුවක් එසේ කිරීමෙන් සුව වී තිබීම සත්‍යයක් බව මං දන්නවා....."

එසේම උළුක්කු ඇදීම සම්බන්ධයෙන් කිසිදු ගාස්තුවක් අය නොකරන බව මෙම සාධක අනුව සනාථවෙයි. උළුක්කු අදින නිවුන්නු 100%ක් ම ප්‍රකාශ කළේ ඔවුන් කිසිදු අය කිරීමක් සිදු නොකරන බව. එහෙත් උළුක්කු සුව වූ පසු එම පුද්ගලයන් නොයෙක් තෑගි ගෙනවිත් දෙන බව 50%ක පමණ ප්‍රතිශතයක් ප්‍රකාශකර තිබුණි. අනෙත් 50% පවසන්නේ සුව වූ රෝගීන් "පිං" දෙන බවයි.

ශ්‍රී ලංකාව තුළ සෑම ප්‍රදේශයක ම පාහේ පවත්නා උළුක්කු සම්බන්ධ ජනප්‍රවාද, චාරිත්‍ර ආදිය එක්රැස් කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් දියත් කිරීමට ජාතික නිවුන් ලේඛණාගාරය මගින් වැඩපිළිවෙළක් සකසා ඇත. ඒ ඇසුරින් නිවුන්නු හා උළුක්කු සම්බන්ධ වෛද්‍ය විද්‍යාත්මක පරියේෂණ ද සිදු කිරීමට ඉදිරියේදී කටයුතු සකස් කර තිබේ. ඔබේ ප්‍රදේශයේත් එවන් තොරතුරු සහ අත්දැකීම් අපට ලියා එවන්න.

## ජාතික විද්‍යා පදනමෙන් පැසසුම්

ජාතික නිවුන් ලේඛණාගාරය මගින් ඉදිරිපත් කරනු ලැබූ ජෛව ආචාරධර්ම ප්‍රඥප්තිය සඳහා ජාතික විද්‍යා පදනම විසින් අප වෙත යොමු කළ 2001.12.24 දින දරන ලිපියෙන් ප්‍රශංසාත්මක ප්‍රතිචාරයක් ලැබී තිබේ. එම ලිපියෙන් උපුටාගත් කොටසක සරළ සිංහල අදහස පහතින් දැක්වේ.

"මෙම වැඩපිළිවෙල විවිධ සංවිධාන අතරත් ජාතීන් අතරත් සිදුවන පරියේෂණ සඳහා යහපත් පිවිසුමක්. ජාතිකව විහිදුනු මෙවැනි නිවුන් ලේඛණාගාරයක් පිහිටුවීම සැබවින්ම ප්‍රශංසාත්මකයි."

## ස්තූතියි !

නිවුන් දරුවන්/පුද්ගලයන්ගේ සම අසමභාවය නිර්ණය කිරීම සඳහා දැනට ලොව දියුණු රටවල භාවිත වන ප්‍රශ්නාවලියක් ඇසුරින් තොරතුරු එක් රැස් කිරීමක් අප පසුගියදා සිදු කරනු ලැබුවා. එහිදී පිළිතුරු එවා සහයෝගය පළ කළ අපේ සාමාජිකත්වයට බෙහෙවින්ම ස්තූතියි. ඒ ඇසුරින් රැස්කළ පරියේෂණ දත්ත වල වාර්තාව ඉදිරි නිවුන් පුවත් කලාපයකින් බලාපොරොත්තු වන්න.

## බහුඋපත් පදනම මඳුරාවල ශාඛාව

මඳුරාවල නිවුන් සංගමය, බහු උපත් පදනමේ වඩාම ක්‍රියාකාරී ශාඛාවක්. පසුගිය කාලය තුළ ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය තුළින් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙන් රුපියල් 10,000 ක ආධාර මුදල් එම ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබා දීමට සමත් වුණා. 2002 අප්‍රේල් මාසයේදී එම සංගමයේ පාසල් යන නිවුන් සාමාජිකයන් සඳහා අධ්‍යාපන උපකරණ බෙදා දීමක් ද සංවිධානය කරනු ලැබුවා. එහිදී ජාතික නිවුන් ලේඛණාගාරය ද ඔවුන්ට අනුග්‍රහය දක්වනු ලැබුවා.

## කතුවැකිය 1 වෙනි පිටුවෙන්...

නොවන බව බොහෝ දෙනා හොඳින් තේරුම් ගෙන නොමැත. මේ තත්ත්වය තේරුම් ගත් අප, වෛද්‍ය ප්‍රජාව අතර පමණක් නොව ජනතාව අතරද පර්යේෂණ සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ අරමුණ ඇතිව, එහි පළමු පියවර ලෙස නිවුන් ලේඛනාගාරය පිහිටුවන ලදී. පසුගිය වසර 5 පුරා සාර්ථක ලෙස මෙම කටයුත්තේ මුල් අදියර දියත් කළ අප, ජාතික නිවුන් ලේඛනාගාරයේ පැවැත්ම තහවුරු කර ඇති අතර, එය ලෝක නිවුන් පර්යේෂණ ප්‍රජාව තුළමේ ඉහළ තලයක රැඳවීමට ද සමත් වූයෙමු. පර්යේෂණ කිරීමට අවශ්‍ය වටපිටාව සකස් කිරීම අපගේ මූලික අරමුණ වූ අතර, විශේෂයෙන්ම පර්යේෂණ සඳහා අත්‍යවශ්‍ය ප්‍රවේශයක් ලෙස, පර්යේෂණ ආචාර ධර්ම රාමුවක් ගොඩ නැඟීමටත් උත්සුක වූයෙමු.

එම පර්යේෂණ නිවුන් ප්‍රජාවේ අවශ්‍යතාවයන් මත ගොඩනැඟූ ලබන සේවා පහසුකම් ඇති කිරීම සඳහා ඉලක්කකර ගැනීම අපගේ අරමුණයි. අප අපගේ වගකීම් සාර්ථක ලෙස ආරම්භ කර ඇත්තෙමු. මේ කාර්යය තුළ ඔබගේ වගකීම කුමක් ද? අප කරන කටයුතු සඳහා ඔබගේ සහාය උපරිම ලෙස ලබා දීම පමණක් ද? නැත, කිසිසේත් එය එසේ නොවිය යුතුය. අපට අවශ්‍ය වන්නේ අපගේ පර්යේෂණ කටයුතු සාර්ථක වීම පමණක් නොවේ.

ඔබගේ කාර්යභාරය පර්යේෂණ වලට ලක්වනු ලබන නිවුන් දරුවන් හෝ පුද්ගලයන්වීම පමණක් නොවේ. මින් ඔබ්බට දිවයන බරපතල යුතුකම් හා වගකීම් ප්‍රමාණයක් ඔබ සතුව ඇත. ඔබගේ සහභාගීත්වය සක්‍රිය සහභාගීත්වයක් විය යුතුය. රට තුළ ස්ථාපිත විය යුතුයයි අප පවසන මේ පර්යේෂණ සංස්කෘතිය කුමක්දැයි ඔබ විසින් සොයා බැලිය යුතුය. ඒ සඳහා අවශ්‍ය දැනුම ඔබ ලබාගත යුතුය. පර්යේෂණ න්‍යාය පත්‍රය සැකසීමේ දී එම කාර්යභාරයට උරදීම සඳහා පුරුදු පුහුණු විය යුතුය. පර්යේෂණයන්ට ලක්වන්නවුන්ගේ අයිතිවාසිකම් සුරැකෙන පරිදි, එම පර්යේෂණ වල අවසාන ප්‍රතිඵල සහ ප්‍රතිලාභ සමාජ සුබසිද්ධිය සඳහා යොමුවන පරිදි, පර්යේෂණ ආචාර ධර්මපද්ධතියක් හා රාමුවක් ගොඩනගා අධීක්ෂණය කිරීමේ වගකීමට උර දීමට ඔබ දැනුවත් විය යුතුය. මේ සඳහා ඔබ ඔබගේම වූ සංවිධාන රටාවක් ගොඩ නගා ගත යුතුය. පර්යේෂකයන්ට ඔබගේ සාමූහික දිරිය පුද කරන අතර පර්යේෂකයන් ජනතාවට වග කියනු ලබන සංස්කෘතියක් නිර්මාණය කළ යුතුය.

නිවුන් ප්‍රජාව තුළ සිටින වඩා දැනුවත් කොටස මේ සඳහා පෙරමුණ ගත යුතුය.ස්වභාවිකපර්යේෂණාගාරයක් බවට පත්වූ නිවුන් ප්‍රජාව සමස්ත මිනිස් වර්ගයාගේ සුභ සිද්ධිය සඳහා පිරිනැමිය හැකි නව දැනුමට සැබෑ අරුතක් එක් කරනු ඇත්තේ එවිටය.

### දියුණුවන රටවල විද්‍යාත්මක පර්යේෂණ සඳහාවූ ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාවය

දියුණුවෙමින් පවතින රටවල සිදුකෙරෙන ජෛව විද්‍යාත්මක පර්යේෂණ සඳහා යෝජිත ආචාරධර්ම පද්ධතියක් අඩංගු ප්‍රකාශනයක් ළඟදීම එළිදැක්වීමට නියමිතය.

### උඩුනුවරටත් නිවුන් සංගමයක්

උඩුනුවර ප්‍රාදේශීය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් 2002 ජූලි මස 12 වැනි දින උඩුනුවර හා අවට ප්‍රදේශවල සිටින නිවුන් දරුවන්/පුද්ගලයන් රැසක් එකතුවී එම ප්‍රදේශයට නිවුන් සංගමයක් පිහිටුවා ගත් අතර ඒ සඳහා නිවුන් ලේඛනාගාරයේ නියෝජිතයන්ද සහභාගී විය.

This newsletter is supported by a grant from The Wellcome Trust UK

# නිවුන් පුවත්

වෙත:-

..................................................

..................................................

..................................................

..................................................

ආපසු:

ජාතික නිවුන් ලේඛනාගාරය බාරේ
තැ. පෙ. 4,
මුල්ලේරියාව